3

# ඉන්දියාවේ බෞද්ධ ගුහා විහාරයන්හි ආකෘතික ලක්ෂණ

*ඩබ්. කේ. එම්. දීපානී ජයතිලක්*[1]
HU/2012/2172

ඉන්දියාවේ බෞද්ධාගමික ගුහා විහාර ඉදිකිරීමේ සම්ප්‍රදාය ක්‍රි.ව. 1 වන සියවසේ සිට ක්‍රි.ව. 10 වන සියවස දක්වාම ව්‍යාප්ත විය. එම බෞද්ධ විහාරයන්හි ආකෘතික ලක්ෂණ පිළිබඳ මෙහිදී අධ්‍යයනය කෙරේ. භික්ෂූන් වහන්සේලාගේ වාසස්ථානයක් මෙන්ම වැඳුම් පිදුම් කිරීමේ ස්ථානයක් වූ මෙම ගුහා විහාර මුල්කාලයේ ථේරවාදී ආගමට ද පසුකාලයේ මහායාන ආගමට ද අයත් විය. එම ගුහා විහාර අතර භාජා, බෙත්සා, ජුන්නාර්, කාර්ලේ, නාසික්, පිටල්කෝරා, අජන්තා හා එල්ලෝරා අයත් වේ. මුල් කාලීන ලෙන්වල වහලයෙහි දැව පරාල තිබූ බවට සාධක හමුවුව ද පසුකාලයේ ශිලා තලයෙහි කැටයම් කිරීමට උත්සාහ ගත්හ. බොහෝ චෛත්‍යශාලාවන් හි බිම් සැලැස්ම අශ්වලාඩම් ආකාරය ගනී. ලෙන් විහාරයන්හි ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වී දෙපස ප්‍රදක්ෂිණා පථ ඔස්සේ ගොස් ස්තූපය වන්දනා කිරීමට හැකිවේ. අජන්තා අංක 9 චෛත්‍යශාලාව චතුරස්‍රාකාර බිම් සැලැස්මට නිදසුනකි. වෘත්තාකාර චෛත්‍යශාලාවන් සඳහා ජුන්නාර් චෛත්‍යශාලාව ගත හැකිය. චෛත්‍ය ආකෘතිය ගැනීමේදී මුල්කාලීන චෛත්‍යශාලාවක් වන භාජාවෙහි චෛත්‍යය සරල නිර්මාණයකි. කාර්ලේ චෛත්‍යශාලාවෙහි ස්තූපය දෙමහල් සිලින්ඩරාකාර කොටසක් මත පිහිටා ඇත. අජන්තා අංක 19 චෛත්‍යශාලාව උස් වේදිකාවක් මත නෙලා ඇති අතර එම වේදිකාව සිරස් තීරු 10කට බෙදා එහි එකක් හැර එකක් බුද්ධ රූප හා ලියවැල් නෙලා ඇත. මේවායෙහි ශෛලමය ඡත්‍ර වේ. චෛත්‍යශාලාවෙන් චෛත්‍යශාලාවට ස්තූප වෙනස්වන අතර මහායාන චෛත්‍යශාලාවන් සඳහා බුද්ධ ප්‍රතිමාව එක් විය. චෛත්‍යශාලාවන්හි කුළුණු අලංකාරය සඳහා පමණක් නිර්මාණය විය. මෙම කුළුණු අටපට්ටම් හැඩයක් ගනී. කුළුණු සඳහා දැව නිර්මාණයන්ගෙන් ලත් ආභාෂය කැපී පෙනේ. එම කුළුණු අඟල් 5ක් පමණ ඇලවී ඇති අතර එය දැව ගොඩනැගිලිවලට ආවේණික ලක්ෂණයකි. කුළුණු පාමුල අලංකාර මැටි බඳුනක හෝ පුන්කලසක ආකාරය ගනී. පසු කාලීන චෛත්‍ය ශාලාවන්හි කුළුණු පාදම සහ හිස සහිත කුළුණු නිර්මාණය විය. චෛත්‍යශාලා ඉදිරිපස ප්‍රධාන දොරටුව ද දෙපසින් අනුද්වාර දෙකක් ද නිර්මාණය කොට තිබේ. ප්‍රධාන ද්වාරයෙන් චෛත්‍යයට ද, අනුද්වාරවලින් ප්‍රදක්ෂිණා පථවලට ද ආලෝකය ලැබේ. ප්‍රධාන ද්වාරයට ඉහළින් වූ චෛත්‍ය කවාටයෙන් චෛත්‍ය ශාලාවෙහි ඉහළ කොටසට ආලෝකය ලැබේ. මෙහි ඔප දැමූ කුළුණු විශාල සංඛ්‍යාවක් පිහිටීමෙන් ආලෝකය පරාවර්තනය විය. ඉන්දියාවේ බෞද්ධාගමික ගුහා විහාරයන්හි ආකෘතික ලක්ෂණ පිළිබඳ මෙම කරුණු අනුව පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: බෞද්ධාගමික ගුහා විහාර, ආකෘතික ලක්ෂණ, චෛත්‍ය ශාලා

*1* දෘශ්‍ය කලා සහ සැලසුම්කරණය (විශේෂවේදී) දෙවැනි වසර